## අධ්‍යාපනඥයකු හා විශිෂ්ඨ දේශප්‍රේමියකු වූ

# එල්. එච්. මෙත්තානන්ද මහතා

## 1894 - 1967

අධ්‍යාපනඥයකු, මිනිස් හිතවාදියකු හා දේශප්‍රේමියකු වූ බෞද්ධ පුනර්ජීවනයට මග පෑදූ එල්. එච්. මෙත්තානන්ද මහතා පරලෝ සැපත් වී මෙම නොවැම්බර් 12 ට වසර 39 ක් සපිරුණි.

වසර 39 ක් ගත වුවද සුවිශේෂ ලංකා පුත්‍රයෙකු වන එතුමාගේ ශ්‍රී නාමය ගෞරව සම්ප්‍රයුක්ත හැඟීමක් අප සිත තුළ දල්වයි. ජනිත කරයි. එතුමා ගැන කියවත්ම එක් ජීවිත කාලයක් තුළ එක මිනිසකුට මේ තරම් භාරදූර, මේ තරම් විශාල වැඩ කොටසක් කරන්නට පුළුවන් වී දැයි කෙනෙකු විශ්මයට පත් කරයි.

පුවත්පත් කලාවේදියකු වූ ඩී. බී. ධනපාල මහතා මෙත්තානන්ද මහතා ගැන ලියූ ලිපියක් 2004 නොවැම්බර් 3 ද අයිලන්ඩ් පුවත්පතේ පළ විය.එය මෙසේ කියයි. "බෞද්ධ සම්මේලන දුසිම් භාගයකට වැඩි ගණනක ශක්තියටත්, එයටම එක් වූ තරුණ බෞද්ධ සමිති සියයක ශක්තියටත් වැඩි ජවයක් මෙත්තානන්ද මහතා තුළ විය."

අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළ තමන වෙත පවරා ගත් වගකීම හා කැපවීම මගින් එතුමා අපට ශේෂ කොට ඇත්තේ අසමාන දායාදයකි. එද මෙද තුර එතුමාගේ ගණයට වැටෙන ඇත්තෝ විරළයහ. මේ සියල්ල මෙත්තානන්ද මහතා කළේ ජාතියට කරන සේවයක් ලෙස විනා කීර්තිය හෝ ලාභය සඳහා නොවේ. අද සමාජයේ එවැන්නන් දුලබය. අප සියලු දෙනා, විශේෂයෙන් ම අධ්‍යාපන ක්ෂෙත්‍රයෙහි නියුක්තයන්, එල්. එච්. මෙත්තානන්ද මහතාගේ පෞරුෂය කෙබඳු එකක් වී දැයි තේරුම් ගෙන තම තමන්ගෙන්, රටට අපේක්ෂා කරන්නේ මොන වාගේ සේවයක් දැයි තේරුම් ගැන්ම වැදගත් ය. වචනයෙන් එතුමාගේ සේවයට සාධාරණයක් කිරීම උගහට ය.

ලොකුසතු හේවා මෙත්තානන්ද 1894 මාර්තු 19 ද අම්බලන්ගොඩ කලුවාඩුමුල්ලේ දී උපත ලැබුවේය. එතුමාගේ දෙමාපියෝ, වෙළෙඳ ව්‍යාපාරිකයෙකු වූ එල්. එච්. කෝවිස් ද සිල්වා සහ වීරසූරිය කරදනාහාමි වූහ. මෙත්තානන්ද, පිරිමි සහෝදරයින් හතර දෙනකු සහ එක සහෝදරියක අතර වැඩිමලා විය. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙහි දී විශිෂ්ඨ වාර්තාවක් තබමින් මූලික අධ්‍යාපනයත්, ද්විතීය අධ්‍යාපනය, ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙහිදී ත් ලැබූ මෙත්තානන්ද, 1912 දී කේම්බ්‍රිජ් ජ්‍යෙෂ්ඨ සහ 1913 දී ලංඩන් මැට්‍රිකියුලේෂන් විභාග සමත් විය. 1914 - 1915 අතර එතුමා කොළඹ ගුරු අභ්‍යාස විද්‍යාලයෙහි දී ගුරු පුහුණුව ලැබීය. 1930 ජූලි මාසයේ දී ලංඩන් ඩේ ට්‍රේනිං විද්‍යාලයෙන් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලත් එතුමා, අධ්‍යාපනය පිළිබඳ මාස්ටර්ස් උපාධියක් සඳහා අඛණ්ඩව ඉගෙනීමේ කටයුතුවල යෙදුණේ ය.

මේ කාල පරිච්ඡේදය තුළ, එනම් 1912 දී පානදුර ශ්‍රී සුමංගල පිරිමි පාසලේත් 1916-18 තුළ කළුතර හෝලි ක්‍රොස් විද්‍යාලයේත් උප ගුරුවරයකු වශයෙන් එතුමා සේවය කළේය. 1919 දී උප ගුරුවරයෙකු වශයෙන් ආනන්ද විද්‍යාලයට බැඳුණු මෙත්තානන්ද මහතා 1923 දී පරම විඥානාර්ථ බෞද්ධ සංගමය විසින් එවකට අළුත් පාසලක් වූ නාලන්දවේ ප්‍රධානාචාර්යවරයා වශයෙන් පත් කරනු ලැබී ය.

1923 දී මෙත්තානන්ද මහතා මුදලි ජේ. ඩී. එස් වික්‍රමසූරියගේ දියණියක් වූ සීලියා සමග විවාහ විය. ඔවුනට පුත්තු තුන් දෙනෙක් හා දියණියෝ දෙදෙනෙක් වූහ.

ඒ සියලු දෙනා යහපත් අධ්‍යාපන සුදුසුකම් ලබා ශ්‍රී ලංකාවේ ප්‍රයෝජනවත් පුරවැසියන් වී පියාගේ නමට ගෞරවයක් අත්කර දීමට සමත් වූහ.

පාසලේ වැඩ, සමාජ සේවය, බෞද්ධ කාර්යභාරයන් යන මේ සියල්ල ඉසුලූ මෙත්තානන්ද මහතා ස්වාමිපුරුෂයකු හා පියකු වශයෙන් තමන් වෙත පැවරුණු සියලු යුතුකම් නොපිරිහෙළා ඉටු කළේය. මේ සියලු යුතුකම් හා කාර්යභාරයන් එතුමා උපරිම ශක්තිය යොදා ඉෂ්ඨ සිද්ධ කළේ කාලය අරපරිස්සමින් යොදා ගනිමිනි.

එතුමාගේ ඇසුර දරුවන් ආදරයෙන් පැතුව ද "රටට කළ සේවය" ස්වාර්ථකාමී වීමට තරම් එතුමාට ඉඩ නොතැබීය. එතුමාගේ මරණින් අවුරුදු 39 ක් ගතවුණු පසුගිය ඉල් පුර පසළොස්වක ද, එතුමාගේ දූ දරුවෝ කොළඹ ඉසිපතනාරාම විහාරස්ථානයේ දී ගෞරවනීය විජිත ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනයක් පවත්වා පියාණන්ට පිං පැමිණවූහ.

### මෙත්තානන්ද මහතාගේ පෞරුෂය

මෙත්තානන්ද මහතා හොඳින් දැන සිටි, මිනිසකු වශයෙන් එතුමාට ගෞරවයෙන් සැලකූ කවුරුත් එතුමා තම ගමන් මග සැකසීමට පියවර 4 ක් පාදක කරගත් බව දැන සිටියහ.

1. එතුමා පෞද්ගලික ලාභ ප්‍රයෝජන නොතැකීය.
2. අනවශ්‍ය වස්තුව රැස් කළේ නැත.
3. වගකීමෙන් තොර ප්‍රකාශ කළේ නැත.
4. ප්‍රජාතන්ත්‍රවාදය නිරතුරුව රැක්කේය.
5. චාම් දිවි පෙවෙතක් ගෙන ගියේය.

මෙත්තානන්ද මහතා ඇත්ත වශයෙනම අපූර්ව මිනිසෙක් විය. ප්‍රතිපත්ති ගරුක බෞද්ධයකු වශයෙන් ඔහු නිර්භීත විය. ඍජු විය. ආත්මාර්ථකාමී නොවීය.



ජාතියේ යහපත වෙනුවෙන් වගකීමක් දැරූ අතර ඒ වෙනුවෙන් ජීවිතය කැප කළේ ය.

මිත්‍රයකු වශයෙන් එතුමා කල්‍යාණ මිත්‍රයෙක් විය. අවංක විය. විනීත විය. කාර්යය ශූරත්වය හා ස්ථානෝචිත ප්‍රඥාව එතුමා කෙරේ. විය. කාටත් සාධාරණ විය. මෙවන් පැසසිය යුතු ගුණාංග ඒකාරාශිව එක තැනැත්තකු කෙරේ පිහිටා තිබීම ඇත්තෙන්ම පුදුමයට හේතුවිය යුතු වුවද මෙත්තානන්ද මහතා තමාගේ හා තම පවුලේ පැවැත්ම සඳහා තෝරාගත් පිළිවෙත එය විය. එතුමා සමාජයේ විවිධ ස්ථරවල අය සමග මිත්‍ර වීමටත්, ඒ කාගේත් ගෞරවය දිනා ගැන්මටත් සමත් විය.

එයම, එතුමාගේ ගුණ යහපත්කම හා පෞරුෂයට සාක්ෂියක් විය. මේ ගුණාංග එතුමා තමා විසින් පවරා ගන්නා ලද ජාතික කාර්යභාරය ගෙන යාමට අවශ්‍ය සහාය ලබාදීමට පොහොසත් විය.

### මෙත්තානන්ද මහතා ජාතියට ඉටු කළ සේවය

මෙත්තානන්ද මහතා ජාතියට කළ සේවය විවිධාකාර විය. ඒවා සාර්ථක කැර ගැන්මට පුළුවන් වූයේ, තමා කෙරේ හා තමන් වටා සිටි අය කෙරේ එතුමා පැනවූ ප්‍රමිතීන් නිසාය. එම ප්‍රමිතීන් කවරේදැයි පහත දැක්වෙන අතර මේ තරම් විශාල කාර්යභාරයක් එක පුද්ගලයෙකුට කරන්නට පුළුවන් වී දැයි සිතේ.

1.අධ්‍යාපනය

මෙත්තානන්ද මහතාගේ අංක එකේ ආදරය අධ්‍යාපනයට විය. එතුමාගේ ලිය කියවිලි පරීක්ෂා කරත්ම එතුමා වැඩ කළ හැම පාසලකම වැඩ කටයුතු සඳහා කොතරම් කාලයක් හා ශ්‍රමයක් වැය කළේ ද කියා පෙනී යයි.

ළමයකුගේ පාසල් ජීවිතය තුළ දැනුම, ක්‍රීඩා, පරාර්ථ සේවය යන ක්ෂේත්‍රයන්හි ඔහුට ලබාගත හැකි උපරිම දැනුම හා යහපත සැලසීමට එතුමා වෙහෙස ගෙන ඇත. ශිෂ්‍ය විනයට ප්‍රමුඛස්ථානය දුන් මෙත්තානන්ද මහතා තමා සේවය කළ හැම පාසලකම ශිෂ්‍යයන්ගේ විනය වර්ධනයට අවශ්‍ය පසුබිම හා පියවර සැලසීය.

තමා ඉගැන්වූ හෝ ප්‍රධානත්වය දැරූ හෝ හැම පාසලකම ගම් පළාත්වලින් පැමිණ අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයන්, විද්‍යාව ඉගෙන ගැනීමටත් එසේම විද්‍යාඥයන් හා වෛද්‍යවරුන් වශයෙන් සුදුසුකම් ලබා ගැනීමටත් එතුමා උනන්දු කළේය.

1932-1936 එතුමා ආනන්ද විද්‍යාලයේ වැඩ බලන අධිපති වශයෙන් සිටි කාලයේදී සහ 1945-1955 විද්‍යාලයාධිපති වශයෙන් සේවය කළ කාලයේදී, පාඨමාලාව ප්‍රායෝගික හා නිර්මාණාත්මක කිරීමෙන් අධ්‍යාපන මට්ටම නගා සිටුවීය. ශිෂ්‍යයන්ට වරදට දඬුවම් දෙනු වෙනුවට වගකීම් දැරීමටත්, ආත්ම ශක්තිය වඩා ගැන්මටත් ඔවුනට ඉගැන්වීය. ළමුන් සිංහල, දෙමළ යන දෙබස දැන සිටිය යුතු යැයි තදින් විශ්වාස කළ මෙත්තානන්ද මහතා මේ භාෂා දෙක ඉගෙනීම ආනන්ද විදුහලේ 1 වන 2 වන ශ්‍රේණිවලට අනිවාර්ය කළේය. පාසලින් පිටවී ගොස් සමාජගත වූවාට පසු ඉංග්‍රීසි හොඳ හැටි භාවිතා කිරීමේ හැකියාව දීමට, ඉංග්‍රීසි විෂයයක් වශයෙන් හොඳට ඉගැන්විය යුතුය යන මතය එතුමා දැරී ය. පුරා අවුරුදු 4 ක් එතුමා ආනන්ද විද්‍යාලයේ ඉංග්‍රීසි හා ලතින් යන භාෂාද්වය ඉගැන්වීය.

එතුමා යටතේ ආනන්ද විද්‍යාලය දුන් අධ්‍යාපනය බෞද්ධ සම්ප්‍රදාය පදනම් කොට ගත්තක් වූ අතර මව් භෂාව, ඉගැන්වීමේ මාධ්‍යය විය. පාඨමාලාවට හස්ත කර්මාන්ත, උද්‍යාන විද්‍යාව හා ගෙවතු වගාව ඇතුළත් කරන ලද අතර වෘත්තිමය අධ්‍යාපනය යටතේ, වඩු වැඩ, පොත් බැඳීම් හා යකඩ වැඩ උගන්වනු ලැබිණ. මෙහි අදහස වූයේ කය වෙහෙසා වැඩ කිරීම අගය කිරීමට ශිෂ්‍යයන් හුරු කිරීමත්, වෘත්තීමය අධ්‍යාපනයක් දීමත්ය. මෙත්තානන්ද මහතාගේ කාලයේදී ආනන්ද විද්‍යාලයේ පුස්තකාලය දියුණු කරන ලද අතර දැනුම වඩා ගැනීම සඳහා කියවීම කෙරේ ශිෂ්‍යයෝ නතු කරනු ලද්දෝය. මෙත්තානන්ද මහතා පුද්ගලිකව පාසල් විද්‍යාගාරය තැනීමේ කටයුතු නිරීක්ෂණය කළේය. අදත් භාවිතා කැරෙන්නේ එසේ ඉදිවුණු ආනන්ද විද්‍යාගාරයයි. 'ආනන්ද විහාරයට' අත්තිවාරම දැමුණේ මෙත්තානන්ද මහතාගේ කාලයේදීය. පාසල් නේවාසිකාගාරය විශාල කිරීම, ගුරු දෙගුරු සමිතිය පටන් ගැන්ම හා ආනන්ද පරෝපකාර සමිතිය පිහිටුවීම මෙත්තානන්ද ආනන්දය තුළ පටන්ගත් තවත් සත්ක්‍රියාවන් ය. පරෝපකාර සමිතිය විසින් ආනන්ද ශිෂ්‍යයන් තුළ පරෝපකාර බීජ්‍යවට වපුරනු ලැබිණ. අධ්‍යාපනයට මුළුමනින්ම කැපවුණු මෙත්තානන්ද මහතා, විද්‍යාලයේ පහසුකම් වැඩිදියුණු කිරීමට ආධාර එකතු කරනු පිණිස සැණකෙළි හා සල්පිල් පැවැත්විය.

ආනන්දයේ ආචාර්ය මණ්ඩලයට විශිෂ්ඨ ගුරු පිරිසක් බඳවා ගැනීමට මෙත්තානන්ද මහතා පොහොසත් වූ අතර, ආනන්ද විද්‍යාලයත්, එහි අනාගතයත් සම්බන්ධයෙන් එතුමා කෙරේ වූ දර්ශනය අගය කළ ප්‍රකට බෞද්ධ දනපතිහු නොමසුරු පරිත්‍යාගයෙන් සිය සහයෝගය පළ කළහ. පාඨමාලා අධ්‍යාපනයට දෙන වැදගත් තැන අතිරේක අධ්‍යයන විෂයන්ට ද දෙනු ලැබිණ.

(රමණී ඩී. වික්‍රමරත්න විසිනි)